BENEDICT XVI Catholic Institute of Higher Education

# BCI ඉංග්‍රීසි පාඨමාලාව

ඉංග්‍රීසි භාෂාව කතා කිරීමේ හැකියාව ප්‍රගුණ කිරීමට මුල් තැන දෙමින් මෙම පාඨමාලාව සකස්කර ඇත්තේ කියවීම, ලිවීම, සවන්දීම, තේරුම් ගැනීම සහ කතා කිරීම යන මූලික භාෂා අංග සියල්ලක්ම ඇතුලත්වය.

## 01. පාඨමාලාවේ අන්තර්ගතය

පාඨමාලාවේ අන්තර්ගතය ප්‍රධාන වශයෙන්ම එදිනෙදා ජීවිතයට අවශ්‍ය ප්‍රායෝගික ඉංග්‍රීසි භාෂාව පදනම් කරගත් විෂය නිර්දේශයකින් සහ ක්‍රමවත් ඉංග්‍රීසි ව්‍යාකරණ අභ්‍යාස මාලාවකින් සමන්විතය.

පාඨමාලාව මට්ටම් 4 කින් සමන්විත වේ. සෑම මට්ටමකම පාඨමාලා කාලය මාස 3 කි. ඇතුලත් කරගැනීමේ විභාගයකින් ශිෂ්‍යයා ඇතුලත්වන පාඨමාලා අදියර තීරණය කෙරේ. එතැන් සිට පාඨමාලාව සම්පූර්ණ කළ හැක.

## 02. ඇතුළු වීමේ සුදුසුකම්

1. **වයස් සීමාව:** වයස අවු. 16 ට වැඩි ඕනෑම ශිෂ්‍යයකු, පාසැල් හැර ගිය අයකු, රැකියාවක නියුතු හෝ රැකියාවක් අපේක්ෂාවෙන් පසුවන අයකුට මීට සම්බන්ධ විය හැකිය.

2. **ඇතුලත් කර ගැනීමේ ලිඛිත පරීක්ෂණය**
   අයදුම්කරුවන් සියලු දෙනා ඇතුලත්කර ගැනීමේ විභාගයට (Entrance Exam) පෙනී සිටිය යුතු අතර විභාගයෙන් අවම වශයෙන් ලකුණු 10 ක් ලබා ගත යුතුය. පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත ශිෂ්‍යයා ඇතුලත් වන පාඨමාලා අදියර තීරණය කෙරේ.

## 03. වාර අවසන් විභාග

සෑම අදියරකම අවසානයේ ඊලඟ අදියරට උසස් කිරීම සඳහා පවත්වන පරීක්ෂණය සමත්විය යුතුය. සමත්වීම සඳහා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 කි. මෙම විභාගයට පෙනී සිටීමට හැකියාව ඇත්තේ පංති සඳහා පැමිණීම 80% මට්ටමෙන් පැවතියහොත් පමණි.

## 04. පාඨමාලා කාල සටහන සහ පංති පැවැත්වෙන දිනයන්

**අ.** අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා පාඨමාලාව (බාලිකාවන් සඳහා පමණි)
*(සෑම අදියරකටම පැය 160 යි)*
පෙරවරු 8.30 සිට පස්වරු 3.45 දක්වා

**ආ.** බදාදා සහ සිකුරාදා
*(සෑම අදියරකටම පැය 160 යි)*
පෙරවරු 8.30 සිට පස්වරු 3.45 දක්වා

## 05. පාඨමාලා ගාස්තු

| | |
|---|---|
| ඇතුලත් කර ගැනීමේ විභාග ගාස්තුව | රු. 250/- |
| ලියාපදිංචි ගාස්තුව | රු. 600/- |
| පාඨමාලා ගාස්තුව | රු.18,900/- |

*(පෙළ පොත් ගාස්තුවද ඇතුළුව)*
*පළමු වාරිකය - රු.9,800/- දෙවන වාරිකය - රු.9,700/-*

## 06. පාඨමාලාවට අයදුම් කළ හැකි ආකාරය

**අ.** www.bci.lk හරහා අප වෙබ් අඩවියට පිවිස online අයදුම්පත් පිරවිය හැකිය. අයදුම්පත් පිරවීම කල හැක්කේ වෙබ් අඩවිය ඔස්සේ පමණකි. ලිඛිත අයදුම්පත් බාර නොගන්නා අතර online අයදුම්පත් පිරවීමට සහය අවශ්‍ය නම් අප කාර්යාලයට පැමිණ ලියාපදිංචි විය හැක.

**ආ.** වෙබ් අඩවිය ඔස්සේ ලියා පදිංචි වීමෙන් පසු අප කාර්යාලයට පැමිණ අයදුම්පත් අංකය (Online Application Reference No) සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර ඇතුලත් කර ගැනීමේ විභාග ප්‍රවේශ පත්‍රය (Entrance Exam Admission Slip) ලබා ගත යුතුය.

**ඇ.** ඇතුලත් කර ගැනීමේ විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂකයා පැමිණිය යුත්තේ දෙන ලද පත්‍රිකාවේ සඳහන් දිනයේ පමණි. විභාගය සඳහා පැමිණෙන විට ජාතික හැඳුනුම්පත සහ විභාග ප්‍රවේශ පත්‍රය (Admission Slip) රැගෙන ආ යුතුය.

**ඈ.** (www.bci.lk) වෙබ් අඩවිය ඔස්සේ ඇතුල් කර ගැනීමේ විභාගයේ ප්‍රතිඵල දැනගත හැකිය.

**ඉ.** පාඨමාලාව සඳහා තේරුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාඨමාලාවට අදාල ගාස්තු බැංකුවට ගෙවා බැංකු ලදුපත ද අදාල සෙසු ලේඛණ ද කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පාඨමාලාව ඇරඹීමට අවම වශයෙන් සතියකට පෙර තම පැමිණීම තහවුරු කර ඇතුලත් කර ගැනීමේ ලිපිය (Letter of Admission) ලබා ගත යුතුය.

## 07. කොන්දේසි

**අ.** ගාස්තු මුදල් ගෙවූ පසු පාඨමාලාවට නොපැමිණීම හෝ මඟදී එය නතර කිරීම නිසා ගෙවූ මුදල් ආපසු ලබා ගත නොහැක.

**ආ.** පාඨමාලාවේ ස්වභාවය සහ කාලවකවානු ආදී කාරණා ගැන ලියාපදිංචි වීමට පෙර දැනුවත් වී සිටීමට අපේක්ෂකයා වගකීමෙන් බැඳී සිටියි.

**ඇ.** BCI ආයතනයට සම්බන්ධ වූ පසු සෑම සිසුවෙක්ම එහි විනය නීති මාලාව පිළිපැදීමට බැඳී සිටියි.


**විමසීම්**
**16 වන බෙනඩික්ට් කතෝලික උසස් අධ්‍යාපන ආයතනය**
නො. 495, මිනුවන්ගොඩ පාර,
බෝලවලාන, මීගමුව.

**031-222 4 422 / 031-222 4 333**
**0766 98 97 97**
www.bci.lk | inquiries@bci.lk